ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2015/07/30 |

## 2015 ජූලි මස උද්ධමනය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයේ (කො.පා.මි.ද.) (2006/07=100) විචලනය මගින් මනිනු ලබන උද්ධමනය, ලක්ෂ්‍යමය පදනම මත ජූනි මාසයේ වාර්තා කළ සියයට 0.1 හි සිට ජූලි මාසයේ දී සියයට -0.2 දක්වා පහළ ගියේය. වාර්ෂික සාමාන්‍ය උද්ධමනය 2015 ජූනි මස පැවැති සියයට 1.7 හි සිට 2015 ජූලි මාසයේ දී සියයට 1.3 දක්වා පහළ වැටිණි. කො.පා.මි.දර්ශකය 2015 ජූනි මාසයේ සිට ජූලි මාසය දක්වා සියයට 0.7 කින් ඉහළ ගියේය.



ලක්ෂ්‍යාමය පදනම මත වාර්තා වූ අඩුවීම සඳහා, 2014 සැප්තැම්බර් මස පටන් අවස්ථා කිහිපයක දී සිදු කරන ලද ඉන්ධන මිල ගණන් සැලකිය යුතු වශයෙන් පහළ දැමීමට ප්‍රථමයෙන් පැවති ඉහළ පදනම ප්‍රධාන වශයෙන් හේතු විය.

කො.පා.මි. දර්ශකයේ මාසික ඉහළ යෑම කෙරෙහි ආහාර මෙන්ම ආහාර නොවන කාණ්ඩවල අයිතමයන්හි මිල ගණන් ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය. සමහර එළවළු වර්ග, මත්ස්‍ය වර්ග, මස් වර්ග, පළතුරු, අර්තාපල්, අමු මිරිස් සහ රතු ළූනු, ආදියෙහි මිල ගණන් 2015 ජූලි මාසයේ දී ඉහළ ගියේය. කෙසේ වුවද, පොල්, ලොකු ළූනු සහ දෙහි ආදියෙහි මිල ගණන් මෙම මාසය තුළ පහළ ගියේය. ආහාර නොවන කාණ්ඩය තුළ, රෙදිපිළි හා පාවහන්; ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා දෛනික ගෘහ ඒකක නඩත්තුව; ප්‍රවාහන; සහ විනෝදාත්මක හා සංස්කෘතික යන උප කාණ්ඩවල මිල ගණන් ඉහළ ගියේය. 2015.07.14 දින සිට ක්‍රියාත්මක වන පරිදි එල්.පී.ගෑස් මිල පහළ දැමීමෙහි ආංශික බලපෑම හේතුවෙන් නිවාස, ජලය, විදුලිය, ගෑස් සහ අනෙකුත් ඉන්ධන උපකාණ්ඩයේ පහළයාමක් වාර්තා විය. සෞඛ්‍ය; සන්නිවේදන; අධ්‍යාපන; සහ විවිධ භාණ්ඩ හා සේවා උප කාණ්ඩ මාසය තුළ දී නොවෙනස්ව පැවතුණි.

ආර්ථිකයෙහි යටිදැරි උද්ධමනය පිළිබිඹු කරන මූලික උද්ධමනය ලක්ෂ්‍යාමය පදනම මත 2015 ජූනි මස පැවති සියයට 2.8 හි සිට 2015 ජූලි මාසයේ දී සියයට 3.5 දක්වා ඉහළ ගියේය. වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය පූර්ව මාසයේ පැවති සියයට 2.8 හිම නොවෙනස්ව පැවතුණි.